(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 229.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 දෙසැම්බර් මස 06 වැනි බදාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

690/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වේවැල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ජීවිකාව කරගත් පිරිස මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) අමුද්‍රව්‍ය හා වෙළඳපොළ පිළිබඳ ගැටලු පවතින බවත්;

(iii) මෙම කර්මාන්තය මඟින් රටට විශාල විදේශ විනිමයක් ගෙන ආ හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වේවැල් නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2015 වර්ෂය තුළ ලබාගත් ආදායම කොපමණද;

(iii) එකී නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, අපනයනය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රට තුළ වේවැල් කර්මාන්තයට අවශ්‍ය වෙළඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1738/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 සහ 2016 වර්ෂවලට අදාළව, ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා 2016.10.18 දිනැති විගණන විමසුමක් නිකුත් වී තිබෙන බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම විගණන විමසුමේ පාසල් පාදක කළමනාකරණ හා පාසල් පාදක ගුරු සංවර්ධනය පිළිබඳව තායිලන්තයේ හා පිලිපීනයේ පැවති ගුරු පුහුණු වැඩමුළුවලට අදාළව, අංක 2, ආ, ඇ, ඈ, ඉ සහ ඊ යන වගන්තිවල දැක්වෙන කරුණු සහ අංක 3 ඡේදයේ දැක්වෙන කරුණු මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) එහිදී සිදු වී ඇති යම් අක්‍රමිකතා, දූෂණ හා නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2169/'17

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය ව්‍යාපෘතිය සඳහා අත්කර ගත් නිවාස, ගොඩ ඉඩම් හා කුඹුරු ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීමට සිටින පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කොපමණද;

(ii) දේපළ අත්කරගෙන ඇතත්, 2014 ඔක්තෝබර් සිට මේ දක්වා වන්දි නොගෙවූ පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කොපමණද;

(iii) මේ දක්වා වන්දි නොගෙවීමට හේතු කවරේද;

(iv) වන්දි මුදල් අධිකරණයේ තැන්පත් කරනු ලබන පදනම කවරේද;

(v) වන්දි මුදල් අධිකරණයේ තැන්පත් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

(vii) නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කිරීමේ පදනම කවරේද;

(viii) මේ දක්වා වන්දි නොලැබ අගතියට පත්වූවන්ට කඩිනමින් වන්දි ගෙවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2187/'17

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුරුවරුන් නව දැනුමෙන් පෝෂණය කිරීමට ගුරු පුහුණු වැඩසටහන් ඉවහල් වන බව පිළිගන්නේද;

(ii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කලාප හා විෂය මට්ටමින් ගුරු පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබුවේද;

(iii) එසේ සංවිධානය කළ ගුරු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව, විෂයයන් හා ඊට වැය වූ මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2016.06.06 දිනට බස්නාහිර පළාතේ, මීනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් පාසල අනුව කොපමණද;

(ii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී ඔවුන් පුහුණු කිරීමට පවත්වා ඇති වැඩසටහන් සංඛ්‍යාව සහ ඊට වැය වූ මුදල, එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ සඳහා වෙන්කළ මුදල හා ක්‍රියාත්මක කළ ගුරු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

(iv) ගුරු පුහුණු වැඩසටහන්වලට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදලින් ප්‍රතිපාදන වෙන් කිරීමට නොහැකි බව දන්නේද;

(v) ජාතික අවශ්‍යතාවයක් සේ සලකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදලින් ගුරු පුහුණු වැඩසටහන්වලට ප්‍රතිපාදන වෙන් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2192/'17

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම පවත්වාගෙන යනු ලැබූ ගුවන් ගමන් වැඩසටහන්, 2016.10.30 දින සිට සී/ස ශ්‍රීලංකන් එයාර් ලයින්ස් වෙත පවරා ගත් බව දන්නේද;

(ii) ඊට සමගාමීව සී/ස ශ්‍රීලංකන් එයාර් ලයින්ස් වෙත බඳවා ගත් මිහින් ලංකා සේවකයන් සංඛ්‍යාව කොපමණද, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එසේ බඳවා නොගෙන සේවය අවසන් කළ මිහින් ලංකා සේවකයන් සංඛ්‍යාව කොපමණද, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) සේවය අවසන් කළ එක් එක් සේවකයාට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) 2016.12.31 දිනෙන් පසුව සේවයේ යොදවා සිටින අයගේ නම් හා තනතුරු කවරේද;

(vi) 2016.12.31 දින තෙක් උපදේශක තනතුරු දරමින් සේවය කළ පිරිස කොපමණද;

(vii) ඉහත (vi) හි සඳහන් පිරිස අතරින් ඉදිරි මාස සඳහා වැටුප් ගෙවා ඇති සංඛ්‍යාව කොපමණද, ඔවුන්ට ගෙවන ලද වන්දි මුදල් සහ වැටුප් හෝ දීමනා කොපමණද;

(viii) ප්‍රමාණවත් වන්දි නොලැබීම නිසා අභියාචනා ඉදිරිපත් කර ඇති සංඛ්‍යාව කොපමණද;

(ix) ඔවුන්ට හිඟ වන්දි මුදල් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2196/'17

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයට අයත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතුවල සේවය කරන කම්කරුවන්ගේ වැටුපෙන් අඩුකරනු ලබන සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් හා පාරිතෝෂික දීමනා 2016 වර්ෂය අවසාන වනවිටත්, වසර ගණනාවක සිට එම කම්කරුවන්ට ගෙවා නැති බව පිළිගන්නේද;

(ii) මෙම වතුවල සේවයේ යෙදී සිටින කම්කරුවන් සංඛ්‍යාව හා මේ වනවිට ඔවුන්ට ගෙවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අරමුදල් ලැබිය යුතු සමහර කම්කරුවන් මේ වනවිට මියගොස් ඇති අතර මෙම මුදල් ඔවුන් වෙත නොගෙවීමෙන් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හට බරපතල අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(iv) මෙම මුදල් වහාම කම්කරුවන්ට ගෙවීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2283/'17

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහජන කටයුත්තක් සඳහා ඉඩම් අත්කර ගැනීම යටතේ, 2017 පෙබරවාරි 13 දිනැති අංක 2006/11 දරන ගැසට් නිවේදනය මඟින්, කොටපොල ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරන ලද ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන් කර තිබේද;

(ii) නොඑසේ නම්, මේ වනවිට අදාළ පවරා ගැනීමේ කටයුතුවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2433/'17

ගරු ඩී. වී. චානක මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය පෞද්ගලිකරණය කිරීමේ ගිවිසුම මඟින් ලබාදෙන ඉඩම් ප්‍රමාණය සහ ඒවා ලබාදෙන පදනම කවරේද;

(ii) මෙම ගිවිසුම මඟින් මෙහෙයුම් පර්යන්ත සඳහා ලබාදෙන ඉඩම් සඳහා බදු කුලියක් අය කරන්නේද;

(iii) මෙම වරායේ තෙවැනි සහ සිව්වැනි අදියර ඉදිකිරීමේ අයිතිය ගිවිසුම්ගත සමාගම් දෙකෙන් එකකට ලබා දෙන්නේද;

(iv) එසේ නම්, ඒවා ලබාදෙන පදනම කවරේද;

(v) හම්බන්තොට වරායේ දෙවැනි අදියරේදී, ඉදිකරන ලද අක්කර 110ක විශාල දූපත මෙම සමාගම් දෙකෙන් එකකට ලබා දෙන්නේද;

(vi) එසේ නම්, ඒවා ලබාදෙන පදනම කවරේද;

(vii) මේ සඳහා දේශීය හෝ ජාත්‍යන්තර සමාගමක් මඟින් තක්සේරුවක් ලබාගෙන තිබේද;

(viii) නොඑසේ නම්, එම වටිනාකම නිර්ණය කරන ලද පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— සුරැකුම්පත් විනිමය,— වෙළෙඳපොළ ආයතන, සුරැකුම්පත් පිළිබඳ මහජන අර්පණයන්, වෙළෙඳපොළ අතරමැදියන් නියාමනය කිරීම සඳහා ද; වෙළෙඳපොළ විෂමාචාර සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ද; කොටස් වෙළෙඳපොළවල් විසින් මුහුණපාන අභියෝග සම්බන්ධව ඵලදායී සහ කාර්යක්ෂම ආකාරයෙන් ක්‍රියා කිරීම සඳහා ද; ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීම සඳහා සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2018) — (විසිඑක්වැනි වෙන් කළ දිනය) — කාරක සභාව (දෙසැම්බර් 05 දින ප්‍රගතිය)

*2.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 12, 14 සහ 22 වගන්ති සමඟ කියවිය යුතු, 32 වගන්තිය යටතේ, සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 28 දිනැති අංක 2029/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.10.09 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 996 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 17 දිනැති අංක 2032/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),—2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 30 දිනැති අංක 2021/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 06 දිනැති අංක 2022/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 06 දිනැති අංක 2022/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 30 දිනැති අංක 2025/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 19 දිනැති අංක 2028/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 26 දිනැති අංක 2029/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 31 දිනැති අංක 2030/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 01 දිනැති අංක 2030/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 9),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 15 දිනැති අංක 2032/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 10),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 16 දිනැති අංක 2032/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 11),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 23 දිනැති අංක 2033/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 12),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 08 දිනැති අංක 2035/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 13),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ඔක්තෝබර් 02 දිනැති අංක 2039/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව,— (235 අධිකාරය වන) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2017.11.18 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2017 අගෝස්තු 11 දිනැති අංක 2031/49 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව,— සලකා බැලීම.

*24.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

29.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36.
ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.
ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.
විසර්ජන පනත් කෙටුම්පත (2018) නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---